“අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කිසිවිටෙක එතුමාණන්ගේ කුඩා දිව පෙනෙන තරමට මහා හඩින් සිනහසෙන්නෙකු ලෙස මා දැක නැත. එතුමා මද සිනහ පාන්නෙකු වූහ.”

මුඃමින්වරුන්ගේ මාතාව වන ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන
ලදී: “අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කිසිවිටෙක එතුමාණන්ගේ
කුඩා දිව පෙනෙන තරමට මහා හඩින් සිනහසෙන්නෙකු ලෙස මා දැක නැත. එතුමා මද සිනහ පාන්නෙකු වූහ.”
[صحيح] [متفق عليه]

"සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සිනහ වීමේ දී තම කුඩා දිව පෙනෙන තරමට මහා හඩින් සිනහ වී නැත" යැයි ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය දන්වා සිටියි. පොඩි දිව යනු යටි උගුරේ එල්ලී පවතින මාංශ කැබැල්ලය. නමුත් එතුමාගේ සිනහව මද සිනහවක් විය.

http://www.sunnah.global/hadeeth/si/show/3060